**වැලිකන්ද ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 03 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජුලි 12 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**

**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට **වැලිකන්ද** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ ඉටු කරන ලද ව්‍යාපෘති සඳහා විමධ්‍යගත අරමුදල් යටතේ ලැබියයුතු හා ගෙවියයුතු රු.700,838 ක් ගිණුම්වල දක්වා නොතිබුණි.

(ආ) සභාව සතු රු. 1,054,126 ක් වූ පුස්තකාල පොත්වල වටිනාකම ශේෂ පත්‍රයෙහි ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

1.3.2 නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

-------------------------------------------------------

| | නීති,රීති,රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | 150(1) , 152(1)හා 153(1) වගන්ති | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් පිළිබඳ වූ ලැයිස්තු පිළියෙල කර වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි |

(ආ) චක්‍ර ලේඛ හා ලිපි

---------------------

| | |
|---|---|
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මැයි 26 දිනැති අංක එන්සී/පී/එල්ජී/ඒ/14/2 හා 2015 දරන ලිපිය | ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා පරිපාලන කමිටු තීරණ ගෙන නොතිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නියමයන් අනුව ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර ගැනිමකින් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි |

02. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.1,120,053 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු. 4,084,286 ක් විය.

03. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

(අ) සභාව සතු ආදායම් ප්‍රභවයන් නිසි ලෙස හඳුනා නොගෙන, ඇස්තමේන්තු සකස් කිරීම හා ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් ඇතැම් ආදායම් විෂයයන්ගේ තථ්‍ය ආදායම, ඇස්තමේන්තුගත ආදායමට වඩා ඉතා පහළ අගයක් ගෙන තිබුණි.

(ආ) සභාවට අයත් වාහන නවතා තැබීම සඳහා රු. 238,296 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබුණු රථවාහන අංගනය හා ගබඩා කාමරය භාවිතයට ගෙන මාස 8 ක් ගතවීමටත් පෙර කඩා ඉවත්කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාව වෙත ලබාදී තිබුණු රු. 235,821 ක් වටිනා ගැල්වනයිස් බට 213 ක් සභාවේ හිටපු මන්ත්‍රීවරුන් විසින් රැගෙන ගොස් ආපසු ලබාදී නොතිබුණු අතර වගකිව යුතු පාර්ශව වෙතින් අදාල වටිනාකම් අයකර ගැනිමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මාස කිහිපයක සිටම මුදල් පොත අනුව බැංකු ශේෂය සෘණ අගයක් ගෙන තිබුනු අතර 2015 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව බැංකු ශේෂය රු. 277,214 ක සෘණ අගයක් විය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

(අ) පරිපාලන කමිටු රැස්වීම් පැවැත්වීම හා තීරණ ගැනීම විධිමත් ක්‍රියාපටිපාටියකට අනුව සිදුවී නොමැති අතර කමිටු තීරණ සටහන් කර ඇති ලේඛනය ඉතාමත් අවිධිමත් තත්ත්වයක පැවතුණි.

(ආ) අනුමත තනතුරු 11 ක පුරප්පාඩු හා තනතුරු 04 ක අතිරික්තයක් ද පැවති අතර සේවකයින් 06 දෙනෙකු අනියම් පදනම මත සමාලෝචිත වර්ෂයේදී බඳවාගෙන තිබුණි. මේ සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(1) වගන්තිය ප්‍රකාරව තනතුරු ඇති කිරීම සහ වැටුප් නියම කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

04. යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය
----------------------------------------

4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම
-------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව ප්‍රාදේශීය සභා පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
--------------------------

සභාවේ මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරිම
----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් කිසිදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

-----------------------------

(අ) නිෂ්ක්‍රීය වත්කම්

--------------------

(i) සහල් පිටි සහ සහල් ආශ්‍රිත නිෂ්පාදනය සඳහා 2008 සහ 2009 වර්ෂවලදී වටිනාකම රු. 613,500 ක්වූ උපකරණ උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යංශයෙන් ලැබී තිබුණු අතර 2016 මාර්තු මාසය වන විටද එම උපකරණ අපේක්ෂිත අරමුණු සඳහා යොදාගෙන නොතිබුණි.

(ii) පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලබාදුන් මුදල් හා වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ මුදල් වශයෙන් එකතුව රු. 750,000 ක් වැය කරමින් ඝණ අපද්‍රව්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා 2007 වර්ෂයේදී වැලිකන්ද පොල භූමිය තුල ඉදිකරන ලද ගොඩනැගිල්ල වර්ෂ 8 කටත් අධික කාලයක් තිස්සේ නිශ්කාර්යව පැවතින.

(iii) සභාව සතු WPLE – 7473 දරන මහෙන්ද්‍රා කැබ් රථය අලුත්වැඩියා කර භාවිතයට ගතහැකි වුවද, වර්ෂ 2 කට අධික කාලයක සිට එම කැබ් රථය අලුත්වැඩියාවකින් තොරව නිශ්කාර්යව පැවතින.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

-------------------------------

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

4.5 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

----------------------------------------------------------

2009 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා නිකුත් කරන ලද විගණන විමසුම් 07 ක් සඳහා 2016 මාර්තු මාසය වන විටත් පිළිතුරු ලබාදී නොමැති අතර ඒ සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරිත්වය විසින් කිසිදු අවධානයක් යොමුකර නොතිබුණි.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) මූල්‍ය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය